# පරීක්ෂක වාර්තාව

**අදියර III විභාගය - ජනවාරි 2024**

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

---

## A කොටස

මෙම කොටස ලකුණු පහ බැගින් වූ ප්‍රශ්න හතරකින් සමන්විත විය.

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** තනි පුද්ගල ව්‍යාපාරයක් පරිවර්තනය කළ හැකි ව්‍යාපාරික සංවිධාන වර්ග දෙකක් දැක්වීමත්, **(b) කොටසින්** එකී **(a) කොටසින්** හඳුනාගන්නා ලද ව්‍යාපාර සංවිධාන වර්ග වලට අදාළව බදුකරණය සහ වගකීම සඳහා වූ නෛතික පැතිකඩයන් හඳුනා දැක්වීමත් අවශ්‍ය විය.

සියලුම අයදුම්කරුවන් පාහේ ප්‍රශ්නයේ කොටස් දෙකටම පිළිතුරු සපයා තිබුණි. ඔවුන් හවුල් ව්‍යාපාරයක් සහ සීමිත පොදු සමාගමක් ලෙස පිළිතුරු ලබා දීමෙන් **(a) කොටස** සඳහා සාර්ථකව සම්පූර්ණ ලකුණු ලබා ගත්හ. කෙසේ වෙතත්, **(b) කොටස** නිවැරදිව වටහා නොගැනීම හේතුවෙන් ඇතැම් අයදුම්කරුවන් අදාළ නොවන පිළිතුරු ලබා දී තිබුණි.

**සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතිණි.**

### ප්‍රශ්න අංක 02

අවදානම් කළමනාකරණ ආකෘතිමය රාමුවක් භාවිතයෙන් ලැබෙන අවස්ථාවන් (opportunities)/ වාසි (benefits) මත පදනම් වූ සරල ප්‍රශ්නයකි. ව්‍යාපාර අවදානම් හඳුනා ගැනීම සහ සංවිධානය තුළ එම අවදානම් අවම කිරීම සඳහා පියවරයන් නියමිත වේලාවට ක්‍රියාත්මක කිරීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම අපේක්ෂා කරන ලදී.

අයදුම්කරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් ප්‍රශ්නයට පිළිතුරු සැපයූ නමුත්, සම්පූර්ණ ලකුණු ලබා ගත්තේ කිහිප දෙනෙක් පමණි. මෙයට මූලික වශයෙන් හේතු වූයේ, බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයේ අවශ්‍යතාවය වූ, අවදානම් කළමනාකරණයේ වාසි කෙරෙහි අවධානය යොමු කිරීම වෙනුවට, නිවැරදි අවබෝධයකින් තොරව, අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටි පැහැදිලි කිරීමයි.

**සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොපැවතිණි.**

## ප්‍රශ්න අංක 03

**(a)** ප්‍රශ්නයේ මෙම කොටසින් සහතිකවීමේ කාර්යභාරයක පාර්ශ්වයන් තුන පැහැදිලි කිරීම අවශ්‍ය විය. පිළිතුරු සැපයූ බොහෝ අයදුම්කරුවන් නිවැරදි පැහැදිලි කිරීම් ලබා දී තිබුණු අතර, කිහිප දෙනෙකු නිවැරදි අවබෝධයකින් තොරව, මූල්‍ය තොරතුරු භාවිතා කරන්නන් විස්තර කර තිබුණි.

**(b)** ප්‍රශ්නයේ මෙම කොටසින් අවශ්‍ය වූයේ "සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක්" සහ "සීමිත සහතික වීමේ කාර්යභාරයක්" අතර වෙනස හඳුනා ගැනීමයි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම කොටස සඳහා හොඳ අවබෝධයක් පෙන්නුම් කළ අතර ඔවුන් ඉහළ ලකුණුද ලබා ගත්හ.

**සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

## ප්‍රශ්න අංක 04

**(a)** මෙම කොටසින් අදාල ආචාරධර්ම අවශ්‍යතාවයන් යටතේ ඇති විගණන සමාගමක් විසින් පවත්වා ගත යුතු ‘‘ස්වාධීනත්වය’’ යන්න පැහැදිලි කිරීමට අවශ්‍ය විය.

අයදුම්කරුවන් කිහිප දෙනෙකු තම පිළිතුරු සඳහා නිශ්චිත අධ්‍යයන කොටස් නිවැරදිව හඳුනාගෙන තිබුණි.

අයදුම්කරුවන් බහුතරයක් විසින් ස්ව අධ්‍යයන පොතෙහි ඇතුලත් 8 වන පරිච්ඡේදයේ, 8.3 කොටසෙහි සඳහන් අචාරධර්ම අවශ්‍යතා කොටසෙහි විස්තර කර ඇති පරිදි "ස්වාධීනත්වය" කෙරෙහි අවධානය යොමු කර තිබූ අතර, ඇතැමුන්, ස්වාධීනත්වය යන්න පෙනුමෙන් සහ මනසින් ස්වාධීන වීම ලෙස විස්තර කර තිබුණි. ස්වාධීනත්වයට තර්ජන ඇති කරන විශේෂ අවස්ථා සහ සම්බන්ධතා පිළිබඳ පැහැදිලි කිරීම් කිහිපයක්ද ඇතුළත් විය. ඇතැම් අයදුම්කරුවන් නිසි අවබෝධයකින් තොරව, තත්ත්ව පාලන පද්ධතියක අඩංගු මූලිකාංග හය සහ ආචාර ධර්ම සංග්‍රහයේ මූලධර්ම පැහැදිලි කර තිබුණි.

**(b)** මෙම කොටසින් බලාපොරොත්තු වූයේ, විගණන කාර්යභාරයක් "සමාලෝචනය" කිරීමේදී සලකා බැලිය යුතු කරුණු ලැයිස්තුගත කිරීමයි. අයදුම්කරුවන් සැලකිය යුතු ප්‍රමාණයක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා තිබූ අතර, බහුතරයක් මෙම කොටසට වැඩි ලකුණු ලබා ගන්නා ලදී. බොහෝ දෙනෙක් හුදෙක් විගණන සාක්ෂි එකතු කිරීම සම්බන්ධ සාමාන්‍ය පිළිතුරු සැපයූ අතර ඇතැම් අයදුම්කරුවන් විගණන සාක්ෂි, විෂය පථය සහ වෘත්තීය සංශයවාදය (Professional Skepticism) වැනි විගණන තාක්ෂණික යෙදුම් සඳහන් කර තිබුණි.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුනි.**

## B කොටස

මෙම කොටස ලකුණු 10 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න තුනකින් සමන්විත විය.

### ප්‍රශ්න අංක 05

**(a)** සමස්ත විගණන උපාය මාර්ගය පිහිටුවීමේදී, විගණක විසින් සළකා බැලිය යුතු කරුණු සහ ලබා දී ඇති තොරතුරු මත පදනම්ව **සීමාසහිත නීම් හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගමේ** විගණක විසින් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම පරීක්ෂකවරයා විසින් මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලදී.

අයදුම්කරුවන් විශාල සංඛ්‍යාවක් මෙම ප්‍රශ්නයට සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණි. එහිදී ඔවුන් සමාගම ඉදිකිරීම් කර්මාන්තයේ සිට මැණික් කර්මාන්තයට මාරුවීම පිළිබඳ මූලික සහ සාමාන්‍ය කරුණු ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ඔවුන්ට බොහෝ විට මැණික් අගය කිරීම සඳහා විශේෂඥයින් යොදා ගැනීම, මැණික් අපනයන රෙගුලාසි සහ නිෂ්පාදනයේ තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම වැනි විශේෂිත ක්ෂේත්‍ර මග හැරී තිබුණි.

**(b)** ලබා දී ඇති තොරතුරු මත පදනම්ව මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට විශේෂිත වූ වාර්තාකරණ අවශ්‍යතාවලට අනුකූල වීම සහ විෂය ප්‍රවීණයන්ගේ භාවිතය වැනි අවධානය යොමු කළ යුතු නිශ්චිත ක්ෂේත්‍ර / පැතිකඩ හඳුනා ගැනීම අයදුම්කරුවන්ට අභියෝගයක් විය. ඒ වෙනුවට ඔවුන් සාමාන්‍ය පිළිතුරු ලබා දී තිබුණි.

කෙසේවෙතත්, බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා සාමාන්‍ය අගයට වඩා ලකුණු ලබාගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

### ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය කොටස් තුනකින් සමන්විත විය.

**(a)** "වංචාවක්" යන්න නිර්වචනය කිරීම මෙම කොටසින් විමසා තිබූ අතර, අයදුම්කරුවන් සියල්ලක්ම පාහේ පිළිතුරු සපයමින් සම්පූර්ණ ලකුණු ලබා ගත්හ.

**(b)** මූල්‍ය ප්‍රකාශනවල වංචා සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන් කිහිප දෙනෙකු පමණක් මෙම කොටසට ඉතා හොඳින් පිළිතුරු දුන් අතර, බොහෝ දෙනා සඳහන් කර තිබුණේ, විගණකවරුන් විසින් අතිරේක කාර්යයන් සිදු කර අධ්‍යක්ෂවරුන්ට වංචා පිළිබඳ වෙනම වාර්තාවක් ලබා දිය යුතු බවයි. වංචා හඳුනාගැනීමේ සහ වාර්තා කිරීමේ අවකාශය තුළ කළමනාකරණයේ සහ බාහිර විගණකවරුන්ගේ භූමිකාවන් සහ වගකීම් පිළිබඳ මූලික අවබෝධයක් නොමැතිකම මෙයින් පෙන්නුම් කරයි.

**(c)** ප්‍රශ්නය තුලම  පිළිතුර සඳහා ප්‍රමාණවත් කරුණු ඇතුලත් වූ බැවින් සතුටුදායක ලෙස පිළිතුරු සපයා තිබුණි. වංචනික මූල්‍ය වාර්තාකරණයෙහි අවධානම වැඩි කළ හැකි තත්ත්වයන් හෝ සිදුවීම් පිළිබඳව විස්තර කර තිබුණේ අයදුම්කරුවන් අතලොස්සක් පමණි.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය මධ්‍යස්ථ විය.**

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය තුලින් නව විගණන කාර්යභාරයක් බාරගැනීම, ඒ හා සම්බන්ධ තර්ජන හඳුනා ගැනීම සහ එම තර්ජන අවම කිරීමට ගත යුතු ආරක්ෂිත ක්‍රම යෝජනා කිරීම යන කරුණු පරීක්ෂා කිරීම සඳහා විශේෂිත අවස්ථාවක් ඉදිරිපත් කර තිබුණි.

**(a)** බාහිර විගණන කාර්යභාරයක් බාරගැනීමේදී විගණක විසින් සලකා බැලිය යුතු ප්‍රධාන පැතිකඩයන් සහ අවශ්‍යතාවයන් පැහැදිලි කිරීම අපේක්ෂා කළ අතර සියලුම අයදුම්කරුවන් පාහේ මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණි. ඔවුන්ගෙන් බහුතරයක් සැලකිය යුතු ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන තිබුණේ, මූලික වශයෙන් ප්‍රධාන පැති දෙකක් සම්බන්ධයෙන් පුළුල් ලෙස  පැහැදිලිව අසා තිබූ නිසාවෙනි.

**(b)** සහ **(c)** කෙසේවෙතත්, අයදුම්කරුවන් නිසි පරිදි ආචාරධර්ම වල මුලධර්මයන්ට අනුකූල නොවීමට අදාළ තර්ජන හඳුනා ගැනීමත් ඒවා අවම කිරීමට අදාළ පියවරයන් දැක්වීමටත් අපොහොසත් වූ බැවින් ප්‍රශ්නයේ **(b)** සහ **(c)** **කොටස්** සඳහා නිසි පිළිතුරු සැපයීමට අපොහොසත් වී තිබුණි. අයදුම්කරුවන්ගෙන් කිහිප දෙනෙක් තර්ජන නිවැරදි හඳුනා ගත් නමුත් පැහැදිලි කර තිබුණේ වෙන කිසිවක්ය. අවාසනාවන්ත ලෙස, අයදුම්කරුවන්ගෙන් බහුතරයකට **(c)** **කොටසට** නිවැරදි  පිළිතුරු දැක්වීමට අපොහොසත් වුයේ එය **(b)** **කොටසේ** පිළිතුර මත පදනම් වූ නිසාවෙනි.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය දුර්වල විය.**

## C කොටස

මෙම කොටස ලකුණු 25 බැගින් වූ අවස්ථා සම්බන්ධ, අනිවාර්ය ප්‍රශ්න දෙකකින් සමන්විත විය.

## ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය මගින් අභ්‍යන්තර පාලන සහ ක්‍රියා පටිපාටි ආවරණය විය:

බොහෝ අයදුම්කරුවන් ඔවුන් සතු ප්‍රායෝගික අත්දැකීම් සහ ස්ව-අධ්‍යයන පොත් යනාදිය මගින්, විශේෂයෙන් ස්ව අධ්‍යයන පොතෙන් ලබාගත් දැනුම උපයෝගී කර ගනිමින්,  ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබූ අතර වෙන් කර ඇති ලකුණුවල සාමාන්‍යයට වඩා ලබා ගැනීමට සමත් විය.

**(a)** මෙම ප්‍රශ්නය ලබා දී ඇති සිදුවීම මත පදනම් වූ **සීමාසහිත Plumbing World සමාගමෙහි** අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු දුර්වලතා හඳුනා ගැනීමත්, එකී දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමත් අපේක්ෂා කරන ලදී. සියලුම අයදුම්කරුවන් පාහේ මෙම කොටසට පිළිතුරු සපයා තිබුණි. කෙසේ වෙතත්, ප්‍රශ්නය තුළම පිළිතුරු අතුලත් වුවත්, මෙම කොටස සඳහා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සුළු පිරිසක් අසමත් වී තිබුණි.

**(b)** ගැනුම් සහ තොග වලට අදාලව ස්ථාපනය කළ හැකි පාලන ක්‍රියාකාරකම් යෝජනා කිරීම සහ අභ්‍යන්තර පාලන පද්ධතියක අරමුණක් වශයෙන් "මෙහෙයුම්වල සඵලදායිතාව සහ කාර්යක්ෂමතාව" යන්නෙහි අර්ථය පැහැදිලි කිරීම අපේක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබූ නමුත්, බොහෝ දෙනෙක් ප්‍රමාණවත් ලකුණු ලබා ගැනීමට අසමත් වූහ. මෙයට හේතු වූයේ ගැනුම් සහ තොග පාලන ක්‍රියාවලියේ දුර්වලතා නිසි ලෙස හඳුනා ගැනීමට අපොහොසත් වීමයි. මීට අමතරව, බොහෝ දෙනෙක් ප්‍රශ්නයේ දෙවන කොටස සඳහා "මෙහෙයුම්වල ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාව" පිළිබඳ ප්‍රමාණවත් නොවන පැහැදිලි කිරීම් සපයා තිබූ අතර බොහෝ විට හුදු වචන හෝ පුද්ගලික අර්ථ දැක්වීම් ඉදිරිපත් කරමින් නිවැරදි පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.

**(c)** අයදුම්කරුවන් බහුතරයක් විසින් අභ්‍යන්තර පාලන පද්ධතියේ ආවේණික සීමාවන් හඳුනාගෙන නිවැරදි පිළිතුරු දක්වා තිබුණේ නැත.

**(d)** විකුණුම් පද්ධතියට අදාළව ස්ථාපනය කළ හැකි යෙදවුම් පාලනයන් සහ පොදු පාලනයන් දැක්වීම මෙම කොටසින් පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් මෙම කොටස සඳහා උදාහරණ දක්වමින් පිළිතුරු සපයා ලකුණු ලබා ගත් නමුත්, තොරතුරු තාක්ෂණික පාලනයන් පිළිබඳ ඔවුන්ගේ දැනුම සීමිත බව පෙන්නුම් කළහ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුනි.**

## ප්‍රශ්න අංක 09

මෙම ප්‍රශ්නය A කොටස සහ B කොටස ලෙස කොටස් දෙකකින් සමන්විත විය.

### A කොටස

විශ්ලේෂණාත්මක ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම, සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු වලට අදාලව සිදු කරන විගණන ක්‍රියා පටිපාටිවල යෝග්‍යතාවය සහ සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු හඳුනාගැනීම සම්බන්ධයෙන් විගණකගේ වගකීම මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කරන ලදී. තවද, මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් සමාලෝචනය කිරීමේදී සිදු කළ හැකි විගණන ක්‍රියා පටිපාටි ද මෙමගින් පරීක්ෂා කරන ලදී.

අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම කොටසට පිළිතුරු සපයා තිබූ අතර විශ්ලේෂණ ක්‍රියා පටිපාටි හඳුනා ගැනීම සඳහා සම්පූර්ණ ලකුණු ලබා ගත්හ. කෙසේ වෙතත්, සම්බන්ධිත පාර්ශ්ව සමග ගනුදෙනු හඳුනාගැනීමේ වගකීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම දුර්වල වූ අතර, එය කළමනාකාරිත්වයේ වගකීමක් බව බොහෝ දෙනා ප්‍රකාශ කර තිබුණි. මීට අමතරව, අයදුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සම්බන්ධිත පාර්ශ්ව සමග ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන ක්‍රියා පටිපාටිවල යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා නිසි ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වී තිබුණි.

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් සමාලෝචනය කිරීම සරල ප්‍රශ්නයක් වූ නිසාවෙන් අයදුම්කරුවන්ගෙන් බහුතරයක් පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණි.

**B කොටස**

විගණකවරයාගේ වාර්තාවේ මතය ගොඩනැගීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම, විවිධ අවස්ථා තුනක් ඉදිරිපත් කරමින් ඇගයීමට ලක් කල විශිෂ්ට ප්‍රශ්නයකි.

**සීමාසහිත A සමාගමට** අදාලව දී තිබූ තොරතුරු අනුව, සාවද්‍ය ප්‍රකාශනයන්ගේ ප්‍රමාණාත්මකබව සහ පුළුල් බව හේතුවෙන් අහිතකර මතයක් (Adverse Opinion) ඉදිරිපත් කළ යුතු බව අයදුම්කරුවන්ගෙන් බහුතරයක් නිවැරදිව හඳුනාගෙන තිබුණි.

**සීමාසහිත B සමාගමට** අදාලව දී තිබූ තොරතුරු අනුව, අයදුම්කරුවන් කිහිප දෙනෙකු නිවැරදි පිළිතුරු සපයා තිබූ අතර, සාවද්‍ය ප්‍රකාශය ප්‍රමාණාත්මක නමුත් පුළුල් නොවන බැවින්, තත්වාගණනය කළ මතයක් (Qualified Opinion) ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණි.

**සීමාසහිත C සමාගමට** අදාලව දී තිබූ තොරතුරු අනුව, අයදුම්කරුවන් විශාල සංඛ්‍යාවක් එය විෂය පථය සීමා කිරීමක් බව විශ්වාස කර අහිතකර මතයක් ලබා දීමට යෝජනා කර තිබූ අතර ඉතා සුළු පිරිසක් තත්වාගණනය කළ මතයක් ලබා දිය යුතු බව ප්‍රකාශ කර තිබුණි.

**B** සහ **C** යන අවස්ථා දෙකේදීම, ඇතැම් අයදුම්කරුවන් පොදුවේ විකරණය කළ මතයක් ලබා දිය යුතු බව සඳහන් කළ නමුත් විකරණය කිරීම කුමක්ද යන්න දක්වා තිබුණේ නැත.

**ප්‍රශ්නයේ මෙම කොටස සඳහා සමස්ත කාර්යසාධනය අවම මට්ටමක පැවතුනි.**

\- - -

**<u>විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:</u>**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.
- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.
- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.
- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දැ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් විභාගවල ප්‍රශ්නවලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.
- ප්‍රශ්න පත්‍ර වල පරීක්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසින් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මගින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.
- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙළ කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නගා ගැනීම සිදුකළ යුතුය.
- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.
- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.
- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.
- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට එළදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.
- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.
- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍ය කරන පශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

\- * * * -